**ශීර්ෂය 212 - විභාග දෙපාර්තමේන්තුව**
**-----------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 තත්ත්වාගණනය කළ මතය
------------------------------

විභාග දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විභාග දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාර දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූනි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට විභාග දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) මෙම වාර්තාවේ 1.6.1 (අ) ඡේදයේ සඳහන් නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වසරේ ඇතුළත් කර තිබූ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුද්‍රණ අංශය වෙත මිලදී ගනු ලැබූ රු.546,264,452 ක් වටිනා ටර්න් කී මුද්‍රණ යන්ත්‍රය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට ඇතුලත් කර නොතිබුණි. | එකඟ වන බව | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු බව. |
| (ආ) | 9160 wip building & structure යටතේ වර්ෂය තුළ මිලදී ගැනීම් මූල්‍ය ප්‍රකාශන අනුව රු.66,104,844 ක් වුවද වැය ලෙජරය අනුව රු.67,816,761 ක් වූයෙන් වෙනස රු.1,711,917 ක් විය. | එකඟ වන බව | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු බව. |
| (ඇ) | දෙපාර්තමේන්තුව පිහිටි ඉඩමේ තක්සේරු වටිනාකම වූ රු.630,000,000 ක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ දක්වා තිබුණ ද එම ඉඩම දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වන බව | පවරා ගැනීමට කටයුතු කළ යුතු බව |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් නොවන ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ඉවතලන කඩදාසි විකිණීමෙන් ලැබිය යුතු රු.14,066,912 ක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වන බව. | හිඟ හිටි ආදායම් රැස්කර ගැනීමට කටයුතු කිරීම. |

**2.2 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 16 කට අදාළව සියයට 20 සිට සියයට 100 දක්වා පරාසයක රු.1,595,872,127 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. | එකඟ වන බව | නිසි අධ්‍යයනයකින් පසු ඇස්තමේන්තු සකස් කළ යුතු බව. |
| (ආ) | වැය විෂයන් 04 ක මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 50 ඉක්මවූ එකතුව රු.211,662,600 ක ප්‍රතිපාදන මු.රෙ. 66 මගින් මාරු කරගෙන තිබුණි. | එකඟ වන බව | නිසි අධ්‍යයනයකින් පසු ඇස්තමේන්තු සකස් කළ යුතු බව. |

**2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ ලැබුණු රු.792,000 ක් වටිනා කඩදාසි, අවශ්‍යතාවය සඳහා නොගැලපෙන බැවින් ප්‍රතික්ෂේප කර එම තොගය ගබඩාවේ රඳවාගෙන වටිනාකම 2020 වර්ෂයේ සිට බැදීම් හා බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | එකඟ වන බව | බැරකම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පැරණි විභාග ප්‍රතිඵල ලේඛන ස්කෑන් කිරීමට සමාලෝචිත වර්ෂයේ පෞද්ගලික ආයතනයක් සමඟ රු.15,341,940 ක වටිනා බැඳීම් වලට එළඹ තිබුණි. අදාල ආයතනය විසින් 2021 නොවැම්බර් ස්කෑන් කිරීමේ නියැදියක් අවසන් කර දෙපාර්තමේන්තුවට භාර දී ඇතත් එම නියැදිය නිවැරදි දැයි බලා අදාල ආයතන සමඟ විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. | එකඟ වන බව | බැරකම් හා බැඳීම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව |
| (ඇ) | ඉකුත් වර්ෂවල බැරකම් හා බැඳීම්වලට ඇතුළත් කර නොතිබූ එහෙත් නිල නිවාස 03 ක් මිලදී ගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.17,820,562 ක් හා පාඨමාලා ගාස්තු රු.388,500 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ගෙවීම් කර තිබුණි. | එකඟ වන බව | ඉකුත් වර්ෂවල හඳුනානොගත් හා වාර්තා නොකළ බැරකම් බැඳීම් සඳහා ගෙවීම් නොකළ යුතු ය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ (ආ) ඡේදය | එක් අවස්ථාවක දී රු.100,000 ක උපරිමය සීමාව ඉක්මවා අවස්ථා 07 කදී රු.12,453,200 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබා දී තිබුණි. | එකඟ වන බව | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | දෙපාර්තමේන්තුවේ කිසිදු වාහනයක් මාස 12 කට වරක් හෝ කි.මී. 25,000 ක ධාවනයකින් පසු ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | එකඟ වන බව | - එම - |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කර 2019 පෙබරවාරි අවසන් කිරීමට නියමිත කොන්ත්‍රාත් වටිනාකම රු.564,320,835 ක් වූ සයමහල් බහු කාර්යය ගොඩනැගිල්ල සඳහා සමාලෝචිත වර්ෂයේදී ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳව මධ්‍යම උපදේශක කාර්යංශයට රු.57,902,852 ක් හා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට රු.199,634,570 ක්, ගෙවා තිබුණ ද 2021 දෙසැම්බර් 31 දින වන විටත් එහි වැඩ අවසන් කර නොතිබුණි. | එකඟ වන බව | කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව නියමිත දිනට වැඩ අවසන් කර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු බව. |

### 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ 10.2 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වන බව | චක්‍රලේඛය පරිදි කටයුතු කල යුතුය. |

### 3.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රශ්න පත්‍ර වල රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා රු.8,428,637ක් වටිනා ටර්න් කී මුද්‍රණ යන්ත්‍රයේ Wrapping Solution කොටස 2018 වර්ෂයේ මිලදීගෙන තිබුණ ද කිසිදු ප්‍රයෝජනයක් නොගෙන මිලදී ගත් දින සිට නිශ්කාර්යව තිබුණි. | එකඟ වන බව | කඩිනමින් වත්කම ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රශ්න පත්‍රවල මනා නිමාවක් ලබා ගැනීම මගින් විභාග අපේක්ෂකයින්ගේ විශ්වාසනියත්වය නංවාලීම හා රහස්‍යභාවය උපරිමයෙන් ආරක්ෂා කර ගැනීමේ අරමුණින් රු.546,264,452 ක වියදමක් දරා ටර්න් කී මුද්‍රණ යන්ත්‍රය මිලදී ගෙන තිබුණ ද 2022 වර්ෂයේ පවත්වන ලද 2021 අ.පො.ස (උසස් පෙළ) විභාගය සඳහා ප්‍රශ්න පත්‍ර 4,898,000 ක් මුද්‍රණය කර ඇති අතර එයින් පිටපත් 509,000 ක් හෙවත් සමස්ථ ප්‍රශ්න පත්‍රවලින් 10% ක් පමණක් මෙම යන්ත්‍රයෙන් මුද්‍රණය කර තිබුණි. | එකඟ වන බව | යන්ත්‍රයෙන් උපරිම ප්‍රයෝජන ගත යුතුය. |

### 3.4 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතන විභාග පැවැත්වීම වෙනුවෙන් 2018 – 2021 කාලයට අදාලව රාජ්‍ය ආයතන 35 කින් රු.324,515,433 ක මුදලක් අයකර ගත යුතුව තිබුණි. | එකඟ වන බව | විභාග පැවැත්වීමේ වියදම් පියවාගැනීම සඳහා හෝ නිශ්චිත හා විධිමත් ක්‍රමවේදයක් සකස් කර ගත යුතුය. |
| (ආ) | නව ගාස්තු පොත අනුව රහස්‍ය ලේඛන කටයුතු සඳහා වර්ෂයට ගෙවනු ලබන උපරිම මාස 06 ක් සීමාව ඉක්මවා ඉකුත් වර්ෂයේදී ගෙවා තිබුණු රු.628,456 ක් ආපසු අයකරගෙන නොතිබුණි. | එකඟ වන බව | අයකරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නව ඩිජිටල්කරණ වැඩසටහන සඳහා දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණු ටැබ් පරිගණක 700 පාසල් විභාග ඇගයීම් ශාඛාවේ කටයුතු සඳහා ප්‍රමාණවත් නොවන බැවින් ඌණ උපයෝජිතව ගබඩාවේ තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව මාස 24 ක් වූ ටැබ් පරිගණකවල වගකීම් කාලය 2022 ජනවාරි 31 දින වන | එකඟ වන බව | වත්කම් ප්‍රයෝජනයට ගැනීමට හා පොත්වලට ඇතුළත් කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විට මාස 14 ක් ගතවී තිබුණද ඒවායේ වටිනාකම හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් පිළිබද ප්‍රකාශයට ද ටැබ් පරිගණක 665 ක් තොග පොත් වලටද ඇතුළත් කර නොතිබුණි. | | |
| (ඇ) | 2015 වර්ෂයේ සිට 2020 දක්වා පාසැල් විභාග සහ ආයතනික විභාග පැවැත්වීමේදී රඳවාගත් ජංගම දුරකථන 545 ක් හා සන්නිවේදන උපකරණ 09 ක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණි. | එකඟ වන බව | විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කළ යුතු ය. |
| (ඉ) | 2016 වර්ෂයේ සිට 2020 දක්වා පාසල් විභාග අංශය වෙත යොමුකරන ලද අක්‍රමිකතා සම්බන්ධයෙන් වූ විමර්ශන සිද්ධීන් 1,039 ක් සඳහා විමර්ශන කටයුතු නිමකර නොතිබූ අතර, 2021 දෙසැම්බර් 31 දිනට ආයතනවලට බඳවා ගැනීම් විභාග සඳහා වූ සිදුවීම් 3,118 ක් සහ සහතික පත්‍ර සහ අනෙකුත් සිදුවීම් 2,792 කට අදාල විමර්ශන කටයුතු 2022 ජනවාරි 31 වන විටත් සිදු කර නොතිබුණි. | එකඟ වන බව | විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කළ යුතු ය. |
| (ඊ) | 2018 වර්ෂයේදී රු.28,500,000 ක් වැය කර ස්ථාපනය කර තිබුණු සූර්යබල ශක්ති පද්ධතියේ නිෂ්පාදන ධාරිතාවය හා පරිභෝජනය පිළිබඳ අපැහැදිලිභාවය නිසා පත්කල දෙපාර්තමේන්තු කමිටුවේ 2018 ඔක්තෝබර් 08 දිනැති තීරණය අනුව, සම්පූර්ණ විදුලි නිෂ්පාදනය විදුලි බල මණ්ඩලයට අලෙවි කල යුතු වුවද 2021 වර්ෂය අවසන් වන විටද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | එකඟ වන බව | කමිටු තීරණය අනුව කටයුතු කළ යුතු බව. |
| (උ) | 2018 වර්ෂයේ 12 ශ්‍රේණියේ සිසුන් සඳහා සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය, සිසුන් 130,224 ක් සඳහා 2019 ඔක්තෝබර් මස රු.100,252,667 ක මුදලක් වැයකර මාර්ගගත ක්‍රමයට පවත්වා 2021 නොවැම්බර් ප්‍රතිඵල නිකුත් කර තිබුණි. ප්‍රශ්න පත්‍ර 02 සඳහා ම | එකඟ වන බව | සැලසුම්ගතව විභාග පැවැත්වීම සඳහා විධිවිධාන යොදාගැනීම |

අයදුම්කරුවන් 56,051 පමණක් පිළිතුරු සපයා තිබූ අතර අයදුම්කරුවන් 4,945 ක ගේ පිළිතුරුපත් පිළිබඳව කිසිදු තොරතුරක් දෙපාර්තමේන්තුවට ලබාගත නොහැකි වී තිබුණි.

**04.** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වෙනුවෙන් රු.මිලියන 352.6 ක් වැය කර තිබුණි. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල පුරප්පාඩු 192 ක් පැවතුණු අතර ජ්‍යෝෂ්ඨ මට්ටමේ නිලධාරීන් 14 ක ගේ සහ තෘතියික මට්ටමේ නිලධාරින් 12 ක පුරප්පාඩු එයට ඇතුළත් වී තිබුණි. | එකඟ වන බව | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බව |